# පන්හිඳයි පින්සලයි



සිසිර දිසානායක

# තමන්ම ඇඳගැනිල්ල

''අළුත් අවුරුද්දකුත් ලැබුවා එහෙනං'' පන්හිඳ ඇඳේ ම දිග ඇදුනා.

''2020 නව වසර හැමෝටම සුබ නව වසරක් කියලා පතමු ඉතින්'' පින්සල අනික් ඇඳේ ඉඳගෙන පන්ගේ කතාවට එකතු වුණා. පැන්සල තවම නිදි.

''2019 කොහොම ගෙවුණද හිතාගන්නත් බෑ වගේ. ඒ තරම්ම ඉක්මනින් ගෙවුණෙ. කාලෙ යනවා. අපි වයසට යනවා. අළුත් කට්ටියක් මේ ලෝකෙ බාර ගන්නවා...'' පන් හුස්මක් හෙළුවා.

''ඒ බාර ගන්න කට්ටිය හුරු කරවන එක තමයි අපිට කරන්න තියෙන හොඳම දේ...'' පින්ගේ කතාවට පන් ආයෙමත් ලොකු හුස්මක් ගත්තා.

''අපේ සිංහල ඉස්කෝලෙකටවත් සම්බන්ධ වුණා නං....?''

බිත්තිය පැත්තට හැරිලා නිදාගෙන උන්නට පැන්සලත් මේ කතාවට කන් දීගෙනයි ඉඳලා තියෙන්නේ. පැන් කතාවට එක්වුණේ ඔහොම.

''ලේසි නෑ ඒ වැඩේ. හොඳ කැපවීමක් තියෙන්න ඕන.'' පන් කිව්වෙ ටිකක් බරට, හිතර අරගෙන.
''අනික වගකීම?'' ඒ පින්. සිංහල භාෂාව උගන්නන සති අන්ත ඉස්කෝල ගණනාවක ම වාර්ෂික ප්‍රසංග කීපයකට ම පන් - පින් - පැන් තුන්දෙනා ගියා. පන් ඒ ගැන ''සන්නස'' පත්තරේට දිග ලියුමකුත් ලිව්වා.

''ඒ අතරේ ගුරුවර ගුරුවරියෝ, විදුහල්පතිවරු මහන්සිවෙලා කරන කියන දේවල් අගය කරලා මාධ්‍ය වල කතා කරන එක, ලියන එක අපේ යුතුකමක්'' පින් කීවේ පන්ව උනන්දු කරවන්නත් එක්ක.

''ඒ ප්‍රසංගවල අංග ගැන වාර්තාවක් වගේ ලියන එකේ තේරුමක් තියෙනවද හැබෑට?

'' ඒ පින්.

''ඒ උත්සව ආවරණය කරන්නයි ඔය සටහන් ලියන්නේ. ඒ වගේම ඒ වෙහෙස වෙන උදවියගේ නම් වුණත් ඇතුලත් කරන්නේ ඒ අයට කෘතවේදී වෙන්න. හැබැයි මෙදා පාර නම් නාමිකව සටහන් කරන්න බැරි වුණා. උත්සව හතරක්ම ගැන ලිව්ව නිසා..'' පන් උත්තර බැන්දා.

''ඒත් ඔය උත්සව ගැන විචාරයක් විදියට හොඳ නරක ගැන ලිව්වොත් නේද වැඩිය ප්‍රයෝජනවත්? '' පැන් කොහොමත් තර්ක විතර්කවලට හපන්.

''එහෙම නැත්තෙමත් නෑ ඉතින්. එහෙම දේවල් ටිකක් තමුන්නැහෙලාත් මතක් කළොත් ලියන්න බැරි කමක් නෑ.''

''බ්‍රන්ස්වික් ඉස්කෝලේ දරුවෝ අර ජාතික ඇඳුමින්, ඔසරියෙන් ඇවිත් බුලත් හුරුළු දීලා පිළිගන්න එකට මං හරි කැමතියි. කොහොමත් ලොකු උත්සාහයක් ගන්නවා වේදිකාව ලස්සනට සරසා ගන්නත්'' පින්ට දැනෙන්නේ ඇඳිල්ලට බර දේවල්නේ. ''ඒත් වැඩිහිටියොම වේදිකාව සරසන්නෙ නැතිව දරුවන්ට අඳින්න තියෙන හැකියාවෙන් ප්‍රයෝජනයක් ගන්නව නම් හොඳ මං හිතන්නේ. අඳින්න හපන් දරුවන්ට ඉඩක් ලබලා දීලා තිබුණෙ මිහිඳු ළමා පදනමේ පොත එළිදැක්විල්ලේ විතරයි. දැරිවියක් ලියපු පොතේ පිටකවරය විතරක් නෙවෙයි, ඇතුල් පිටුත් ඇඳලා තිබුණේ දැරිවියක්ම නේ.''

''ඔව් ඉතින් තමන්ම ඇඳගන්නෙ නැතිව, දරුවන්ගෙ වැඩේනෙ.''

''සමහර විට ඉගෙන ගන්න ළමයින්ට වෙලාවක් නැතිව ඇති. අඩු ගානේ ආදි ශිෂ්‍යයින්ටවත් කිව්වොත් උදව් කරාවි. මට මතක් වෙන්නේ කාලෙකට උඩදි ''කවතා'' මධ්‍යස්ථානයේ ප්‍රසංගයේ ආලෝකකරණය, ශබ්ද පරිපාලනය, වේදිකා පරිපාලනය වගේ හැම දෙයක්ම කළේ ආදි ශිෂ්‍යයෝ.''

''මේ හැම ඉස්කෝලෙකට පාසැල් ගීයක් තිබුණා. නැත්නම් තේමා ගීයක් තිබුණා. ඒවා ගායනා කරන කොට ඒවා ලියපු අය, සංගීතය හදපු අය ගැන එහෙම දැනගන්න අපිත් කැමතියි. තිරයේ දාන එකත් අමාරු දෙයක් නෙවෙයි දැන් තාක්ෂණේ හැටියට.''

''මේ ප්‍රසංගවල සමහර අංගවලට වැඩිහිටියෝත එකතු වෙනවා. ඒක හොඳ දෙයක්. අපේ දරුවන් එක්ක ළං වෙන්න පුළුවන් හොඳ විදියක් ඒක. බලාගෙන ඉන්න අයටත් වෙනසක්. ''පැහැසර'' ප්‍රසංගයේ කවි සංවාදයට එන දැරියන් කවියෙන්ම හඳුන්වා දුන්නේ පංතිභාර ගුරුතුමිය. බ්‍රන්ස්විත් ඉස්කෝලෙ ප්‍රසංගය පටන් ගන්නෙම වැඩිහිටියන් රඟපාන අංගයක් පූර්විකාව, හඳුන්වා දීම විදියට ඉදිරිපත් කරලා''

''එහෙම දේකටනං ඉතින් තමන්ම ඇඳගත්තට කමක් නෑ මට හිතෙන්නෙ'' පන් හිනා වුණා.

''අළුත් තාක්ෂණයට දක්ෂ දරුවන්වත් සම්බන්ධ කරගන්න පුළුවන් නම් හොඳයි මේ දේවල්වලට. සමහර විට වැඩිහිටියන්ට වඩා දක්ෂ අය ඉන්න පුළුවන්. තමන්ගේ එදිනෙදා ඉස්කෝලවල මේ දේවල් කරන අය ඉන්නවා. සමහර ප්‍රසංග ආවරණය කරන්න දර්ශනගත කළේ ආදි ශිෂ්‍යයෝ. පින්තූර ගත්තෙ ශිෂ්‍යාවෝ''

''හැබැයි ඉතින් ඒ අයවත් වේදිකාවට ගෙන්නලා බලන අයට අඳුන්නලා දෙන්න පුළුවන් නම් හොඳ. වේදිකා සැරසිලි කරපු අයවත්. මොකද ප්‍රසංගයක් කියන්නේ නටන, ගයන, රඟන, කතා කරන එක විතරක් ම නෙවෙයිනේ. අනික් දේවල්වලට දක්ෂ අයටත් වේදිකාවේ ඉඩක් දෙනවානම් මොන තරම් හොඳ ද? හොඳ ප්‍රතිපල ගන්න දරුවන්ව නම් හඳුන්වලා දෙනවානේ...''

''පහුගිය කාලේ බලපු ප්‍රසංගවල ලොකුම විහිළුව තමා සිංහල භාෂාව උගන්නන්න කියලා ළමයින්ව ගෙන්න ගන්න ඉස්කෝලයක විදුහල්පතිම පැය බාගයක් විතර ඉංග්‍රිසියෙන් කරපු කතාව.''

''මං ඒත් වටපිටාව බැළුවා; එක සුදු ජාතිකයෙක්වත් හිටියේ නෑ. දරුවන්ට සාරි, ඔසරි, ළමා සාරි, ජාතික ඇඳුම් අඳින්න හුරු කරවන ඉස්කෝලෙක ටයි කෝට් දාගෙන තමන්ම ඇඳගෙන...''

''දෙමව්පියන්, ගුරුවර ගුරුවරියන් ළමයි-න්ට ආදර්ශයක් වෙනව නම් මොන තරම් හොඳ ද? අඩු ගානේ මේ ළමයින් වෙනුවෙන් වෙන් වෙන වෙලාවටවත්. අනික ළමා ප්‍රසංගයක් මුල පැය බාගයකටත් වඩා මේ ලොකු අයගේ කතාවල් කරනකල් අර ළමයි ඇඳුම් ඇඳගෙන වේදිකාව පස්සෙ දුක් විඳින්න ඕන. එක කතාවකුත් නෙවෙයිනේ...''



ප්‍රේක්ෂකා ගාරේ ළමයා වාඩි කරවලා උන්නත් පොඩි අයට මේ කතා අහගෙන මේ තරම් කාලෙ ගත කරන්න, එක විදියකට ඉන්න පුළුවන් ද?

''ඒ ළමයින්ව බලාගන්න ගුරුවරුන්ටත් හොඳ දඬුවම. මොනවා වුණත් කාන්තා පක්ෂයේ අය නම් සාරි ඔසරි අඳින්න උනන්දු වෙනවා. ජාතික ඇඳුම ඇඳගෙන පිරිමි අයට දුවලා පැනලා සංවිධාන කටයුතු කරන්න අපහසුකමක් තියෙන බව නම් ඇත්ත ඉතින්. ඒ වුණාට...''

''තවත් ප්‍රසංගයක දෙමව්පියන් වෙනුවෙන් තාත්තා කෙනෙක් කරපු ඉංග්‍රීසි කතාවත් ඊට දෙවෙනි නෑ.''

''ඒක නම් ඉතිං ප්‍රසංගය අවසානේ කියලවත් කියමුකෝ... ළමයි ඇඳුම් ඇඳගෙන හිරවෙලා දුක් විඳින්න ඕන නෑනේ...''

''අන්තිමට කියන්න තියෙන්නේ මෙහේ හැදෙන ළමයින්ගෙන් අපට ඉගෙන ගන්න හරියටවත් දේවල් තියෙනවා. මතකද

''කවතා'' මධ්‍යස්ථානයේ ප්‍රසංගය අගදී අර ආදි ශිෂ්‍යාවක් කරපු සිංහල කතාව? අපේ දෙවෙනි පරම්පරාවේ දරුවෙක් තමුන්ගේ බාල සහෝදර සහෝදරියන්ට දෙන ආදර්ශයවත් දෙන්න තරමට අපේ සමහර වැඩිහිටියෝ හිතන්නෙ නෑ''

''ඔය ඉතින් දෙන්නෙක් විතරයි. හැමෝම එකට දාන එක හොඳ නෑ. තමන්ම ඇඳගන්න අය නෙවෙයි. කැප වෙලා වැඩ කරන, තිරය පස්සෙ ඉන්න අය තමයි කවදත් වටින්නෙ...''

පන් මූණ හෝදාගන්න ගියා. පැන් ඇඳෙන් නැගිටලා වතුර ටික්ක කටට ගත්තා හෝදා ගන්න. පින් දත් බුරුසුවට බෙහෙත් ටිකක් දාගෙන තවත් කොහාටදෝ ගියා...